(1) මෙතිල් ඔරේන්ජ් (2) $Pb(NO_3)_2$
(3) $Cl_2$ / NaOH (3) HCHO
(5) මින් එකක්වත් උපයෝගී කරගත නොහැකිය.

23. 0.010 $mol\ dm^{-3}$ වන HCl ද්‍රාවණයක $30 cm^3$ සහ 0.005 $mol\ dm^{-3}$ වන $H_2SO_4$ ද්‍රාවණයකින් 20 ml එකට මිශ්‍ර කරණ ලදී. මෙයින් ලැබෙන ද්‍රාවණයේ pH අගය කොපමණ වේද? (සැ. යු. මේ ද්‍රාවණ. සියල්ලම බෙහෙවින් තනුක බව උපකල්පනය කරන්න.)
(1) 2.5 (2) 2.0 (3) 3.0 (4) 3.4 (5) 2.8

24. ජලීය $NH_3$ සමග ජලීය $CH_3COOH$ අනුමාපනය කිරීම සම්බන්ධයෙන් වන මින් කුමන ප්‍රකාශය වඩාත්ම ගැලපේද?
(1) මේ අනුමාපනය සඳහා දර්ශකය වශයෙන් මෙතිල් ඔරේන්ජ් උපයෝගී කරගත හැකිය.
(2) මේ අනුමාපනය සඳහා දර්ශකය වශයෙන් මෙතිල් රෙඩ් උපයෝගී කරගත යුතුය.
(3) මේ අනුමාපනයේදී කැපී පෙනෙන pH විපර්යාසය ඇති වන්නේ 11-9 යන පරාසයේදීය.
(4) මේ අනුමාපනයේදී කැපී පෙනෙන pH විපර්යාසය ඇති වන්නේ 8-12 යන පරාසයේදීය.
(5) ඉහත ප්‍රකාශවලින් එකක්වත් නොගැලපේ.

25. කාබන් සහ නයිට්‍රික් අම්ලය අතර ප්‍රතික්‍රියාවේ ඵල මොනවාද?
(1) $CO_2 + NO + H_2O$ (2) $CO_2 + NO_2 + H_2O$
(3) $CO_2 + N_2O + H_2O$ (4) $CO + NO_2 + H_2O$
(5) $CO + NO + NO_2 + H_2O$

26. $NH_4Br$ සහ $NH_4I$ එකිනෙකින් වෙන් කර හඳුනා ගැනීම සඳහා මින් කුමක් උපයෝගී කරගත හැකිද?
(1) $H_3PO_2$ (2) $Ba(OH)_2$ (3) $H_3PO_4/CHCl_3$
(4) $H_2CrO_4/C_6H_6$ (5) $H_2SO_3/CCl_4$

27. කාබනික සංයෝගයක ඇති මූලද්‍රව්‍ය හඳුනාගැනීමේදී ලැසේන් නිස්සාරකයට $FeSO_4$ ද්‍රාවණයක් එකතු කරන විට කළු අවක්ෂේපයක් ලැබෙන්නේ,
(1) සංයෝගයේ N ඇති විටය.
(2) සංයෝගයේ N සහ I යන දෙකම ඇති විටය.
(3) සංයෝගයේ S ඇති විටය.
(4) සංයෝගයේ P ඇති විටය.
(5) සංයෝගයේ Br ඇති විටය.

28. $C_6H_5CHO$ ෆෙනිල්මෙතනෝල් බවට කෙලින්ම පරිවර්තනය කිරීම සඳහා මින් කුමක් උපයෝගී කරගත හැකිද?
(1) NaOH (2) HCN (3) $CH_3MgI$ (4) HCHO
(5) මින් එකක්වත් උපයෝගී කරගත නොහැකිය.

29. Z නැමැති කාබනික සංයෝගය $HNO_2$ සමග ප්‍රතික්‍රියා කර $N_2$ වායුව ලබාදෙන නමුත්, එම ප්‍රතික්‍රියාවෙන් ෆීනෝල්යක් නොලැබේ. $HNO_2$ සමග ප්‍රතික්‍රියා කිරීමෙන් සෑදෙන ඵලය ප්‍රබල සක්සිවය යටතේ ඔක්සිකරණය කළ විට Y නැමැති සංයෝගය ලැබේ. Y ටෙරිලීන් නිපදවීමේදී උපයෝගී කර ගන්නා අමු ද්‍රව්‍යයකි. Z හඳුනා ගන්න.




30. වඩාත්ම විශාල 4 වැනි අයනීකරණ ශක්තිය දක්වන්නේ මින් කුමන පරමාණුවද?
(1) B (2) Al (3) C (4) Ne (5) Ti

| 31 සිට 40 දක්වා ප්‍රශ්නවලට උපදෙස් | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (a), (b) පමණක් නිවැරදියි. | (b), (c) පමණක් නිවැරදියි. | (c), (d) පමණක් නිවැරදියි. | (d), (a) පමණක් නිවැරදියි. | ප්‍රතිචාර එකක් පමණක් හෝ වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ නිවැරදියි. |

31. සහසංයුජ හා අයනික සංයෝග සම්බන්ධව මින් කුමන ප්‍රකාශ/ ප්‍රකාශය සත්‍ය වේද?
(a) සහසංයුජ සංයෝගවල ද්‍රවාංක කිසි විටෙක ඉහළ විය නොහැකිය.
(b) සහසංයුජ අණුවකදී, වඩා විද්‍යුත් ධන පරමාණුවට/ පරමාණුවලට උච්ච වායුවක ඉලෙක්ට්‍රෝන වින්‍යාසය හැම විටම ලැබේ.
(c) අයනික සංයෝගවල වඩා [illegible] පරමාණුවට/ පරමාණුවලට උච්ච වායුවක ඉලෙක්ට්‍රෝන වින්‍යාසය හැම විටම ලැබේ.
(d) ලෝහ කිසිවක සහභාගිත්වයක් නොමැතිවම, අලෝහ සංයෝජනය වීමෙන් අයනික සංයෝග ඇතිවිය හැකිය.

32. ස්වාරක්ෂක ක්‍රියාව සම්බන්ධව මින් කුමන ප්‍රකාශ/ප්‍රකාශය සත්‍ය වේද?
(a) දුර්වල අම්ලයක් හා ඒ අම්ලයේ ඇමෝනියම් ලවණය ඇති ජලීය ද්‍රාවණයකට ස්වාරක්ෂක ක්‍රියාව දැක්විය හැකිය.
(b) $Ca(HCO_3)_2$ ඇති ජලීය ද්‍රාවණයකට ස්වාරක්ෂක ක්‍රියාව දැක්විය හැකිය.
(c) ජලීය $KHSO_4$ ද්‍රාවණයක් ස්වාරක්ෂක ක්‍රියාව දක්වයි.
(d) ස්වාරක්ෂක ක්‍රියාව දැක්වීමට නම්, හැමවිටම අම්ලයක් හා එම අම්ලයේ ලවණයක් ද්‍රාවණයෙහි තිබිය යුතුය.

33. යකඩවල මල බැඳීම සම්බන්ධව මින් කුමන ප්‍රකාශ/ ප්‍රකාශය සත්‍ය වේද?
(a) ජලයෙහි $FeCl_3$ කුඩා ප්‍රමාණයක් ද්‍රවණය වී ඇති විට යකඩවල මල බැඳීම මන්දනය වේ.
(b) ජලයෙහි $NH_3$ ද්‍රවණය වී ඇති විට, යකඩවල මල බැඳීම මන්දනය වේ.
(c) සින්ක් ලෝහ කුරකට යකඩ සම්බන්ධ කර තැබුවහොත් මල බැඳීම මන්දනය වේ.
(d) ටින් ලෝහ කුරකට යකඩ සම්බන්ධ කර තැබුවහොත් මල බැඳීම මන්දනය වේ.

34. ජලීය $(NH_4)_2SO_4$ ද්‍රාවණයකට සින්ක් කුඩු එකතු කර ඇත. මේ අවස්ථාව සම්බන්ධව මින් කුමන ප්‍රකාශ/ප්‍රකාශය සත්‍ය වීමට ඉඩ තිබේද?
(a) මේ ප්‍රතික්‍රියාවෙන් $N_2$ මුක්ත විය හැකිය.
(b) මේ ප්‍රතික්‍රියාවෙන් $NH_3$ මුක්ත විය හැකිය.
(c) මේ ප්‍රතික්‍රියාවෙන් $H_2$ මුක්ත විය හැකිය.
(d) මේ ප්‍රතික්‍රියාවෙන් $SO_2$ මුක්ත විය හැකිය.

35. සිමෙන්ති නිෂ්පාදනයේදී,
(a) ඩොලමයිට් උපයෝගී කෙරේ. (b) මැටි උපයෝගී කෙරේ.
(c) හයිඩ්‍රොකාබන උපයෝගී කෙරේ. (d) $CaSO_4$ උපයෝගී කෙරේ.

36. මින් කුමන සංයෝග / සංයෝගය $I_2$/NaOH සමග ප්‍රතික්‍රියා කර කහ පැහැති අවක්ෂේපයක් දෙයිද?
(a) $CH_3COC_6H_5$ (b) $CH_3OCH_2C_6H_5$
(c) $CH_3COOCOCH_3$ (d) $ICH_2COCH_2CH_3$

37. $CH_3CONH_2$ සහ $CH_3COONH_4$ එකිනෙකින් වෙන් කර හඳුනා ගැනීම සඳහා මින් කුමක්/ කුමන ඒවා උපයෝගී කරගත හැකිද?
(a) NaOH (b) $Na_2CO_3$. (c) $C_6H_5CHO$
(d) ටොලන් ප්‍රතිකාරකය.

38. $NaCl_2$ යන කල්පිතමය සංයෝගයේ ස්ථායීතාව පිරික්සීම සඳහා මින් කුමක්/ කුමන ඒවා අවශ්‍ය වේද?
(a) සෝඩියම් හි 2 වැනි අයනීකරණ ශක්තිය
(b) NaCl හි දැලිස් ශක්තිය
(c) $MgCl_2$ හි සම්මත උත්පාදන එන්තැල්පිය
(d) $MgCl_2$ දැලිස් ශක්තිය.

39. මින් කුමක්/ කුමන ඒවා වායු සහභාගී වන ප්‍රතික්‍රියාවක ශීඝ්‍රතාව සමග සම්බන්ධ කළ හැකිද?
(a) තත්පර එකක දී සිදුවන සංඝට්ටන සංඛ්‍යාව
(b) ප්‍රතික්‍රියාවේ සම්මත එන්තැල්පි විපර්යාසය.
(c) ඵල අණු වල සම්මත උත්පාදන එන්තැල්පි.
(d) අණුවල මධ්‍යන්‍ය චාලක ශක්තිය.

40. ඇල්ෆා අංශු පිළිබඳ මින් කුමන ප්‍රකාශ/ ප්‍රකාශය සත්‍ය වේද?
(a) ඇල්ෆා අංශු ඉලෙක්ට්‍රෝන අත්පත් කරගෙන හීලියම් අණු සාදයි.
(b) ඇල්ෆා අංශුවල විනිවිද යෑමේ බලය ඉතා කුඩාය.
(c) ඇල්ෆා අංශුවල අයනීකාරක බලය ඉතා කුඩාය.
(d) චුම්බක කේෂ්ත්‍රයකදී ඇල්ෆා අංශු N ධ්‍රැවය වෙත ආකර්ෂණය වේ.

41 සිට 50 දක්වා ප්‍රශ්න වල වගන්ති දෙක බැගින් දී ඇත.

| පළමුවැනි වගන්තිය | දෙවැනි වගන්තිය |
|---|---|
| (1) සත්‍යය. | සත්‍යවන අතර පළමුවැන්න නිවැරදිව පහදා දෙයි. |
| (2) සත්‍යය. | සත්‍ය වන නමුත් පළමුවැන්න නිවැරදිව පහදා නොදෙයි. |
| (3) සත්‍යය. | අසත්‍යය. |
| (4) අසත්‍යය | සත්‍යය |
| (5) අසත්‍යය | අසත්‍යය. |

| | පළමු වගන්තිය | දෙවන වගන්තිය |
|---|---|---|
| 41. | HI වායුව මගින් ආම්ලිකෘත $K_2Cr_2O_7$ ද්‍රාවණයක් කොළ පැහැ ගැන්වේ. | ජලීය $Cr^{3+}$ අයනය කොළ පැහැ වේ. |
| 42. | [illegible] තාපය ඉතාමත් ඉහළ වේ. | [illegible] ඇති බන්ධන සහසංයුජ වේ. |

www.sinhalaelibrary.com
Find more: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

